රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 04/2006 (I)

මගේ අංකය:EST-9/DICIP/06/0195
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.10.31 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්

**<u>රටේ ඇති වී තිබූ තත්ත්වය හේතුවෙන් 1983 ජූලි මාසයට පසු රැකියා අහිමි වූ රජයේ නිලධාරීන්, පළාත් පාලන සේවයේ නිලධාරීන් සහ සංස්ථාවල සේවකයන්ට සහන ලබා දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2006.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 12 ඡේදයේ සඳහන් අභියාචනා භාර ගැනීමේ දිනය පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව 2013.12.31 දින දක්වා දීර්ඝ කිරීමට 2013.10.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006 හි විධිවිධාන අනුව 2006.06.30 ට පෙර අභියාචනයක් ඉදිරිපත් කර ප්‍රතික්ෂේප වූ නිලධාරීන්ට නැවත අභියාචනයක් ඉදිරිපත් කළ නොහැක.

II. නැවත සේවයට පැමිණීම හෝ විශ්‍රාම යෑමට අවස්ථාව තිබූ නමුත් පිළිගත හැකි සාධාරණ කරුණක් මත අදාළ කාලය තුල පැවති චක්‍රලේඛ විධිවිධාන අනුව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි වූ නිලධාරීන් දිවුරුම් ප්‍රකාශයක් මඟින් එකී කරුණු ඉදිරිපත් කරනු ලබන්නේ නම් පමණක් අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදිය හැකිය.

III. අභියාචනා ඉදිරිපත් කරන නිලධාරීන් සම්බන්ධව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මගින් ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගත යුතුය.

03. ඉහත 02 ඡේදයෙහි සඳහන් සංශෝධනයන් හැර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/2006 හි අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතී.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය